# මනුෂ්‍ය ඝාතනය වෙනුවෙන් දහවන හා එකොළොස්වන සියවස්වල ලබා දුන් දඬුවම් ක්‍රම (සෙල්ලිපි කිහිපයක් ඇසුරින් )

අයි. එම්. මදුසංකි*

තත් කාලීන සමාජ ආර්ථික දේශපාලන තොරතුරු අධ්‍යයනය කිරිමේදී නිශ්චිත තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයන් ලෙස සෙල්ලිපි හඳුනාගැනීම යුක්ති යුක්තය. දහවන හා එකොළොස්වන සියවස් පමණ වන විට දී ශ්‍රී ලංකා සමාජයේ ක්‍රියාත්මක වු දඬුවම් අතර මරණීය දණ්ඩනය ද විය. සත්ත්ව ඝාතකයෙකුට උරුම වුයේ ද මරණීය දණ්ඩනයයි. අතීත රජ දවස පටන්ම මෙරට සමාජයේ මරණ දඬුවම ක්‍රියාත්මක කර තිබේ. උල තැබීම, දියේ ගිල්වීම, වං ගෙඩියෙහිලා කෙටීම ආදි බොහෝ දඬුවම් කෙළවර වරදකරුවන්ට හිමිවුයේ ද මරණයයි. ඇතැම් විට දී මනුෂ්‍ය ඝාතනය වෙනුවෙන් හිමි වු දඬුවම වූයේ රටින් පිටුවහල් කිරීමයි. පස්වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය හෙවත් අභයගිරි පුවරු ලිපිය, බදුලු ටැම් ලිපිය, සිව්වන මිහිඳු රජුගේ පුවරු ලිපිය, පනාකඩුව තඹ සන්නස යන මුලාශවල අන්තර්ගත කරුණු ඇසුරින් තත්කාලීනව මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වු ආකාරය පිළිබඳ මෙහි දී විමර්ශනය කෙරේ. අභයගිරි සෙල්ලිපියේ සඳහන් අන්දමට මිනිසුන් මැරූ කෙනෙකු වේ නම් වගකිවයුත්තන් ගමට ඇතුළු වී මිනීමරුවා පමණනක් ම සොයා අල්ලා ගත යුතුය. එයට සම්බන්ධ නොවූ ගම් වැසියන්ට කිසිඳු අකටයුත්තක් නොකළ යුතුය. යමෙකු මනුෂ්‍ය ඝාතනයක් සිදුකර සංඝයා වහන්සේ සමීපයට ප්‍රවිෂ්ට වුවහොත් ඔවුන්ද ඊට සම්බන්ධ සියල්ලන්ද දඹදිවට පිටත් කර හැරිය යුතුය. බදුලු ටැම් ලිපියට අනුව ගමේදී යමෙකු මනුෂ්‍ය ඝාතනයක් සිදුකළහොත් රාජකීය නිලධාරින්ට අසු වී අත්අඩංගුවට ගන්නා තෙක් නවත්වා ගත යුතුය. වේවැල්කැටිය සෙල්ලිපියේ දී සෙසු සෙල්ලිපිවලට වඩා සාධු සම්මත සමාජයක් අපේක්ෂා කර ඇති බව හැඟෙන්නේ දැඩි දඬුවම් ක්‍රම ක්‍රියාත්මක කිරීමට උත්සුක වී ඇති බැවිනි. සමාජයේ සියල්ලන්ගේ ම ජීවත්වීමේ නිදහස තහවුරු කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යන්නේ මනුෂ්‍ය ඝාතනය සේම ගව, එළු වැනි සත්ත්ව ඝාතනය වෙනුවෙන් ද මරණ දණ්ඩනය ක්‍රියාත්මක කර ඇති බව සඳහන් කිරීමෙනි. අභයගිරි, වේවැල්කැටිය, බදුලු ආදි සෙල්ලිපි ගැඹුරින් අධ්‍යයනය කිරීමේදී මෙවැනි දඬුවම් ක්‍රියාත්මක කිරීමේ යුක්තියුක්තතාව හා එහි ලා බලපා ඇති සෙසු සාධක හඳුනා ගැනීමට පුළුවන. ඒ අනුව එදා සමාජයේ සිදු වූ මනුෂ්‍ය ඝාතනය වෙනුවෙන් එකිනෙකට වෙනස් දඬුවම් ක්‍රම ලබා දී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද - මරණ දණ්ඩනය, දඹදිව, අභයගිරිය, තඹ සන්නස, සෙල්ලිපි

---

* සිංහල අධ්‍යයනාංශය , කැලණිය විශ්වවිද්‍යාලය madusankimanjula@gmail.com